# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/18 – 2010 ජූනි 09 වැනි බදාදා – 2010.06.09

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අළුත්කුරු කෝරලේ සුළු කොට්ඨාශයේ ගොංගිතොට සහ පින්නමැද බටහිර ගම්වල පිහිටි සර්වේයර් ජනරාල්ගේ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංක මු.පි. ගම් 3720 හා 2009 සැප්තැම්බර් මස 30 වැනි දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 5 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්. 1.3181ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලි පහට (5) සඳහා මායිම්:

කැබලි අංක 1

ඉඩමේ නම: උළුපෝරනේ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: එස්. ඩී. එලිසබත්, ඒ. එස්. එම්. ගුණසේකර, අංක 14, ශාන්ත ජුඩ් පාර, පින්නමැද, එඩේරමුල්ල, වත්තල; ප්‍රමාණය: හෙක්. 0.1329.

කැබලි අංක 2

ඉඩමේ නම: උළුපෝරනේ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: ඩී. පේද්‍රික්, අංක 687, තුඩුවේගෙදර, රාගම; ප්‍රමාණය: හෙක්. 0.3808.

කැබලි අංක 3

ඉඩමේ නම: උළුපෝරනේ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: එච්. ජයසේන සරම්, එච්. වසන්ත සරම්, එච්. සරත් චන්ද්‍ර සරම්, අංක 610/2, තුඩුවේගෙදර, රාගම; ප්‍රමාණය: හෙක්. 0.2157.

කැබලි අංක 4

ඉඩමේ නම: උළුපෝරනේ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: නිමල් රාලහාමි සහ තවත් අය (ලිපිනය සොයාගත නොහැක); ප්‍රමාණය: හෙක්. 0.3174

කැබලි අංක 5

ඉඩමේ නම: උළුපෝරනේ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: එස්. එම්. ජී. පෙරේරා, අංක 685 බී, තුඩුවේගෙදර, රාගම; ප්‍රමාණය: හෙක්. 0.2713.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2010 ජූලි මස 07 වැනි දින පූ.භා. 10.00 ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 ජූනි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයත්, වන්දි මුදල් හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

තමරා ඩී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2010 මැයි මස 10 වැනි දින,
මහර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 – 523

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද්දේගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.ගම්. 3729 හා 2010.02.16 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.4468ක් පමණ වූ ඉඩම් කොටස. කැබලි විස්තරය පහත සඳහන් කරමි:

කැබලි අංක 1
ඉඩමේ නම: වැකේවත්ත *නොහොත්* මාළිගාවත්ත; විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිලි 2 ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2010 අගෝස්තු මස 18 වැනි දින පූ.භා. 10.00 ට දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 අගෝස්තු මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයත්, වන්දි මුදල් හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ.

2010 ජූනි මස 03 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 – 524

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.